# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය
# இலங்கைச் சனநாயக சோசலிசக் குடியரசு வர்த்தமானப் பத்திரிகை
# The Gazette of the Democratic Socialist Republic of Sri Lanka

අති විශෙෂ　அதிவிசேஷமானது　EXTRAORDINARY

අංක 896/2 – 1995 නොවැම්බර් 07 වැනි අඟහරුවාදා – 1995.11.07

896/2 ஆம் இலக்கம் — 1995 ஆம் ஆண்டு நவெம்பர் மாதம் 07 ஆம் திகதி செவ்வாய்க்கிழமை

**No. 896/2 – TUESDAY, NOVEMBER 07, 1995**

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී.)　(அரசாங்கத்தின் அதிகாரத்துடன் பிரசுரிக்கப்பட்டது)　(Published by Authority)


## I වැනි කොටස : (I) වැනි ඡේදය — සාමාන්‍ය

### ආණ්ඩුවේ නිවේදන

එල්.ඩී. – බී. 21/78 IV.

**1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත**

21 වන වගන්තිය යටතේ නියමය

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 21 වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍ය රිචර්ඩ් පතිරණ වන මම, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විමසා, මේ නියමයෙන්—

(i) සමාජ විද්‍යා හා භාෂා, කළමනාකරණ විද්‍යා හා වාණිජ්‍ය, කෘෂිකර්මය හා විද්‍යාව යන ඉගෙනුම් අංශයන්හි උසස් අධ්‍යාපනය ලබාදීමේ, දියුණු කිරීමේ හා සංවර්ධනය කිරීමේ කාර්යය සඳහා වූ විශ්වවිද්‍යාලයක් 1995 නොවැම්බර් මස 07 වන දින සිට බලපැවැත්වෙන පරිදි පිහිටුවමි ;

(ii) ඒ විශ්වවිද්‍යාලයට "ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය" යන නාමය හා අභිධානය දෙමි ;

(iii) ඒ විශ්වවිද්‍යාලය පිහිටිය යුතු ස්ථානය, රත්නපුර පරිපාලන දිස්ත්‍රික්කයේ විය යුතු බවට නියම කරමි .

(iv) ඒ විශ්වවිද්‍යාලයට සමාජ විද්‍යා හා භාෂා, ව්‍යාපාර අධ්‍යයන, කෘෂිකාර්මික විද්‍යා හා ව්‍යවහාරික විද්‍යා පීඨ පවරා දෙමි ; තවද

(v) මෙහි උපලේඛනයෙහි 1 වන තීරයෙහි දක්වා ඇති ඒ විශ්වවිද්‍යාලයෙහි එක් එක් පීඨය ඒ උපලේඛනයේ 2 වන තීරයෙහි අනුරූප සටහනෙහි දක්වා ඇති අධ්‍යයන අංශයන්ගෙන් සමන්විත විය යුතු යැයි නියම කරමි.

රිචර්ඩ් පතිරණ,
අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍ය.

1995 නොවැම්බර් මස 03 වන දින,
කොළඹ දී ය.

උපලේඛනය

| 1 වන තීරය | 2 වන තීරය |
|---|---|
| සමාජ විද්‍යා හා භාෂා පීඨය | සමාජ විද්‍යා අධ්‍යයන අංශය<br>භාෂා අධ්‍යයන අංශය |

1A – D037972 – 1,060 (95/11)

| 1 වන තීරය | 2 වන තීරය |
|---|---|
| ව්‍යාපාර අධ්‍යයන පීඨය | ව්‍යාපාර කළමනාකරණ අධ්‍යයන අංශය<br>ගණකාධිකරණ හා මූල්‍ය අධ්‍යයන අංශය |
| ව්‍යවහාරික විද්‍යා පීඨය | ස්වාභාවික සම්පත් අධ්‍යයන අංශය<br>භෞතික විද්‍යා අධ්‍යයන අංශය |
| කෘෂිකාර්මික විද්‍යා පීඨය | ආහාර නිෂ්පාදන අධ්‍යයන අංශය<br>අපනයන කෘෂිකාර්මික අධ්‍යයන අංශය<br>කෘෂි-ව්‍යාපාර කළමනාකරණ අධ්‍යයන අංශය |

1-450/1

---

එල්.ඩී.-බී. 21/78 IV.

### 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත

21 වන වගන්තිය යටතේ නියමය

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 21 වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍ය රිචඩ් පතිරණ වන මම, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විමසා, මේ නියමයෙන්-

(i) සමාජ විද්‍යා හා මානව ශාස්ත්‍ර, කළමනාකරණ අධ්‍යයනය හා වාණිජ්‍යය, කෘෂිකර්මය හා විද්‍යාව යන අංශයන්හි උසස් අධ්‍යාපනය ලබාදීමේ, දියුණු කිරීමේ හා සංවර්ධනය කිරීමේ කාර්යය සඳහා වූ විශ්වවිද්‍යාලයක් 1995 නොවැම්බර් මස 07 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි පිහිටුවමි ;

(ii) ඒ විශ්ව විද්‍යාලයට "ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය" යන නාමය හා අභිධානය දෙමි ;

(iii) ඒ විශ්වවිද්‍යාලය පිහිටිය යුතු ස්ථානය, අනුරාධපුර පරිපාලන දිස්ත්‍රික්කයේ විය යුතු බවට නියම කරමි ;

(iv) ඒ විශ්වවිද්‍යාලයට සමාජ විද්‍යාව හා මානව ශාස්ත්‍ර, කළමනාකරණ අධ්‍යයන, කෘෂිකාර්මික විද්‍යා හා ව්‍යවහාරික විද්‍යා සඳහා වූ පීඨ පවරා දෙමි ; සහ

(v) මෙහි උපලේඛනයේ 1 වන තීරයෙහි දක්වා ඇති, ඒ විශ්වවිද්‍යාලයෙහි එක් එක් පීඨය ඒ උපලේඛනයේ 2 වන තීරයෙහි අනුරූප සටහනෙහි දක්වා ඇති අධ්‍යයන අංශයන්ගෙන් සමන්විත විය යුතු යැයි නියම කරමි.

රිචඩ් පතිරණ,
අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍ය

1995 නොවැම්බර් මස 03 වැනි දින,
කොළඹ දී ය.

උපලේඛනය

| 1 වන තීරය | 2 වන තීරය |
|---|---|
| සමාජ විද්‍යා හා මානව ශාස්ත්‍ර පීඨය | සමාජ විද්‍යා අධ්‍යයන අංශය<br>මානව ශාස්ත්‍ර අධ්‍යයන අංශය |
| කළමනාකරණ අධ්‍යයන පීඨය | ව්‍යාපාර කළමනාකරණ අධ්‍යයන අංශය<br>ගණකාධිකරණ හා මූල්‍ය අධ්‍යයන අංශය |
| කෘෂිකාර්මික විද්‍යා පීඨය | වැවිලි කළමනාකරණ අධ්‍යයන අංශය<br>උද්‍යාන විද්‍යා අධ්‍යයන අංශය<br>ආහාර තාක්ෂණ විද්‍යා අධ්‍යයන අංශය |
| ව්‍යවහාරික විද්‍යා පීඨය | ජීව විද්‍යා අධ්‍යයන අංශය<br>භෞතික විද්‍යා අධ්‍යයන අංශය<br>කාර්මික කළමනාකරණ හා පරිගණක විද්‍යා අධ්‍යයන අංශය<br>ගණිත විද්‍යා අධ්‍යයන අංශය |

11-450/2

---

එල්.ඩී. - බී. 21/78

### 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 47(1) වගන්තිය සමග කියවිය යුතු 18 වන වගන්තිය යටතේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් සාදනු ලැබූ නියමාවලිය.

එල්.තාම්,
විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව

1995 නොවැම්බර් මස 03 වන දින,
කොළඹ දී ය.

නියමාවලිය

1. මේ නියමාවලිය 1995 අංක 3 දරන මණ්ඩප සභා නියමාවලිය යනුවෙන් හඳුන්වනු ලබන අතර, ගැසට් පත්‍රයෙහි පළ කිරීමෙන් පසු එය ක්‍රියාත්මක විය යුතු ය.

2. (1) (මෙහි මින්මතු "සභාව" යනුවෙන් හඳුන්වනු ලබන) මණ්ඩප සභාව පහත සඳහන් තැනැත්තන්ගෙන් සමන්විත විය යුතු ය :–

(අ) මණ්ඩපයේ මණ්ඩපාධිපතිවරයා ;

(ආ) මණ්ඩපයේ එක් එක් පීඨයේ පීඨාධිපතිවරයා ;

(ඇ) මණ්ඩපයේ එක් එක් අධ්‍යයන අංශයේ ප්‍රධානයා ;

(ඈ) මණ්ඩපය අනුබද්ධිත විශ්වවිද්‍යාලයේ සභාපතික සභාව විසින්, එහි සාමාජිකයන් අතුරෙන් තෝරා ගනු ලබන සාමාජිකයන් දෙදෙනෙක් ; සහ

(ඉ) මණ්ඩපය අනුබද්ධිත විශ්වවිද්‍යාලයේ පාලක සභාව විසින් මණ්ඩපයේ විවිධ අධ්‍යයන විෂයයන් සම්බන්ධයෙන් විශිෂ්ට සේවාවක් කරනු ලැබූ තැනැත්තන් අතුරෙන් පත් කරනු ලබන සාමාජිකයන් දෙදෙනෙක්.

(2) 2 වන ඡේදයේ (ඈ) අනු ඡේදය යටතේ තෝරා පත් කර ගනු ලැබූ හෝ 2 වන ඡේදයේ (ඉ) අනු ඡේදය යටතේ පත් කරනු ලැබූ සාමාජිකයකු, ඔහු කලින් ධුරය අත්හැර ගියහොත් මිස, අවස්ථාවෝචිත පරිදි, ඔහු තෝරා පත් කරනු ලැබූ හෝ පත් කරනු ලැබූ දින සිට තුන් වසරක කාලයක් ධුරය දැරිය යුතු අතර, අවස්ථාවෝචිත පරිදි නැවත තෝරා පත් කරනු ලැබීමට හෝ නැවත පත් කරනු ලැබීමට ඔහු සුදුස්සෙකු විය හැකි ය.

එසේ වුව ද, තෝරා පත් කරගනු ලැබූ සාමාජිකයකු තමා මණ්ඩපයේ සාමාජිකයකු වශයෙන් තෝරා පත් කර ගැනීමට සුදුසුකම් ලැබූ, විශ්වවිද්‍යාලයේ සභාපතික සභාවේ සාමාජිකයකු වශයෙන් සිටින තාක් කල් ධුරය දැරිය යුතු ය.

(3) යම් පත් කරනු ලැබූ හෝ තෝරා ගනු ලැබූ සාමාජිකයකු ධුර කාලය ඉකුත් වීමට පෙර තම ධුරය අත්හැර ගියහොත්, ඔහුගේ අනුප්‍රාප්තිකයා, ඔහු කලින් ධුරය අත්හැර ගියහොත් මිස, තමා අනුප්‍රාප්තවන සාමාජිකයාගේ ධුර කාලයෙන් ඉකුත් නොවී ඉතිරිව ඇති කොටස සඳහා ධුරය දැරිය යුතු ය.

(4) මණ්ඩපය අනුබද්ධිත විශ්වවිද්‍යාලයේ උපකුලපතිවරයා වෙත යවනු ලබන ලිපියක් මගින් සභාවේ පත් කරනු ලැබූ හෝ තෝරා පත්කරනු ලැබූ යම් සාමාජිකයකුට තම ධුරයෙන් ඉල්ලා අස්විය හැකි ය.

(5) සභාවේ යම් රැස්වීමක ගණපූරණය එහි මුළු සාමාජික සංඛ්‍යාවෙන් තුනෙන් එකක් විය යුතු ය.

(6) මණ්ඩපයක මණ්ඩපාධිපතිවරයා සභාවේ සියලු ම රැස්වීම්වල මූලාසන දැරිය යුතු ය. යම් රැස්වීමක මූලාසන දැරීමට මණ්ඩපාධිපතිවරයාට නො හැකි වන අවස්ථාවක, සාමාජිකයන් විසින්, පැමිණ සිටින තැනැත්තන් අතුරෙන් යම් සාමාජිකයකු ඒ රැස්වීමෙහි මූලාසන දැරීමට තෝරා ගනු ලැබිය යුතු ය.

3. 1979 සැප්තැම්බර් මස 28 වන දින අංක 55/26 දරන අති විශෙෂ ගැසට් පත්‍රයෙහි පළකරන ලද 1979 අංක 3 දරන මණ්ඩප සභා නියමාවලිය මෙයින් ඉවත් කරනු ලැබේ.

11-450/3